# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2028/17 - 2017 ජූලි මස 19 වැනි බදාදා - 2017.07.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදනයයි

**1980 අංක 43 දරන පනතින් සංශෝධිත**
**ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 04 දරන මහ කොළඹ ආර්ථික කොමිෂන් සභා නීතිය**
**(ආයෝජන මණ්ඩල නීතිය). 22(අ) වගන්තිය යටතේ වූ නියමය**

1980 අංක 43 දරන පනතින් සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 04 දරන මහ කොළඹ ආර්ථික කොමිෂන් සභා නීතිය, 22(අ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන වන මම, සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ විෂයභාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත මෙහි පහත සඳහන් උපලේඛනයෙහි විස්තර කර ඇති ප්‍රදේශ, මේ පනතේ කාර්යය සඳහා බලපත්‍ර සහිත කලාප වශයෙන් මෙම නියමයෙන් ප්‍රකාශයට පත් කරමි.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2017 ජූලි මස 17 වැනි දින,
ජනාධිපති කාර්යාලය,
කොළඹ 01.

උපලේඛනය 1

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර සහ ගඟවට කෝරලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ගඟවට කෝරලේ සුළු කොට්ඨාසයේ, මහනුවර මහ නගර සභා සීමාව තුළ කොටුගොඩැල්ල අංක 17 දරන කොට්ඨාසයේ දෙයියන්නේවෙල යනුවෙන් හඳුන්වනු ලබන ග්‍රාමයේ පිහිටා ඇත්තා වූ ද රජයේ මිනින්දෝරු කේ. කතාතරන් විසින් සාදන ලද 2002 ජුනි 28 දින අංක P. P මහ 5345 දරන පිඹුරේ ලොට් අංක 1, 2 සහ 3 ලෙස ලකුණුකර ඇත්තා වූ ද පහත දැක්වෙන මායිම් තුළ පිහිටි (හෙක්ටයාර් 5.0835) බෙදාවෙන්කරන ලද ඉඩම් කොටස් වේ.

එම ඉඩම් කොටස් සඳහා අදාළ මායිම් පහත පරිදි වේ.



මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

01. **ලොට් අංක : 01 - ඉඩමේ නම : බෝගම්බර බන්ධනාගාර ඉඩම; ප්‍රමාණය : හෙක් 3.3674.**

උතුරට : හිරගෙදර මාවත සහ පල්ලිය පාර ද; නැගෙනහිරට : රජපිහිල්ල මාවත සහ මාර්ගය (RDA) ද; දකුණට : මාර්ගය (RDA) සහ ඇහැලේපොල කුමාරිහාමි මාවත ද; බටහිරට : කැප්පෙටිපොල පාර සහ හිරගෙදර මාවත ද වේ.

02. **ලොට් අංක : 02 - ඉඩමේ නම : බෝගම්බර බන්ධනාගාර සංචාරක නිවාස ඉඩම; ප්‍රමාණය : හෙක් 1.6922.**

උතුරට : මාර්ගය ද (RDA සහ රජපිහිල්ල මාවත); නැගෙනහිරට : රජපිහිල්ල මාවත සහ රජපිහිල්ල මාවතේ වරිපනම් අංක 08 දරන පරිශ්‍රය ද; දකුණට : රජපිහිල්ල මාවතේ අංක 08 දරන පරිශ්‍රය, සමුපකාර දෙපාර්තමේන්තුව පිහිටා ඇති බෝගම්බරවත්ත ඉඩම සහ ඇහැලේපොල කුමාරිහාමි මාවත ද; බටහිරට : ඇහැලේපොල කුමාරිහාමි මාවත සහ මාර්ගය (RDA) ද වේ.

03. **ලොට් අංක : 03 - ඉඩමේ නම : බෝගම්බර වත්ත ඉඩම; ප්‍රමාණය : හෙක් 0.0239.**

උතුරට : ලොට් අංක 2 ද; නැගෙනහිරට : රජපිහිල්ල මාවත ද; දකුණට: ලොට් අංක 2 ද; බටහිරට: ලොට් අංක 2 ද වේ;

08 - 79

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.